**ශීර්ෂය 278 -රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 278 - රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2016 මැයි 04 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමා ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථා, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධාන, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

-------

**2.1 විසර්ජන ගිණුම**

-----------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

-----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 901 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 852 ක් උපයෝජනය කර තිබිණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 49 ක් හෙවත් සියයට 5.44 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබිණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 734.20 | 730.41 | 3.79 | 0.52 |
| මූලධන | 167.00 | 121.27 | 45.73 | 27.38 |
| එකතුව | 901.20 | 851.68 | 49.52 | 5.49 |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත වෙනත් අමාත්‍යාංශ 26 ක් හා දෙපාර්තමේන්තු 17 ක් විසින් එකතුව රු.මිලියන 2,501 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. මිලියන 2,250 ක් උපයෝජනය කර තිබිණි. ඒ අනුව සළසා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 251 ක් හෙවත් සියයට 10 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබිණි.

## 2.2 අත්තිකාරම් ගිණුම්

**රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමා**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල විෂය අංක 27801 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමා හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** |
| 61.34 | 43.97 | 39.00 | 45.61 | 200.00 | 152.09 |

## 2.3 අග්‍රිම ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වූ අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට රු.100,000 ක බැර ශේෂයක් පැවැති අතර එය 2016 ජනවාරි මාසයේදී නිරවුල් කර තිබුණි.

## 2.4 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ තැන්පත් ගිණුම් 07 කට අදාළව 2015 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 515 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 6000/0000/00/0002/0056/000 | 1,371,650 |
| 6000/0000/00/0013/0043/000 | 1,458,765 |
| 6000/0000/00/0018/0013/000 | 29,031,000 |
| 6000/0000/00/0001/0042/000 | 1,075,880 |
| 6000/0000/00/0016/0011/000 | 328,249,104 |
| 6000/0000/00/0017/0002/000 | 156,122,706 |
| 6003/0000/00/0054/0000/000 | (2,294,477) |
| **එකතුව** | **515,014,628** |

**2.5 විගණන නිරීක්ෂණය**

-----------------------

රත්නපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

-----------------------------------------------

**3.1 විසර්ජන ගිණුම**

-------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2015 වර්ෂයට අදාළව එළඹ තිබුණු රු.117,181 ක බැරකම්, 2016 වර්ෂයේ දී පියවා තිබුණ ද, එම බැරකම් විසර්ජන ගිණුමේ දක්වා නොතිබිණි.

**3.2 අග්‍රිම ගිණුම**

--------------

2015 දෙසැම්බර් 23 දිනැති අංක 06/2016 දරන භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛයේ 2.2 ඡේදය පරිදි 2015 දෙසැම්බර් 31 දිනට මුදල් පොතේ ශේෂය 2016 ජනවාරි 04 දිනට පෙර භාණ්ඩාගාරය වෙත පියවීමට කටයුතු කළ යුතු වුවත්, එය 2016 ජනවාරි 07 හා 20 දිනවල පියවා තිබුණි.

**3.3 පොදු තැන්පත් ගිණුම**

**--------------------------**

අංක 6003/0000/00/0054/0000/000 දරන තැන්පතු ගිණුමේ ශේෂය අතාත්ත්වික ලෙස රු.2,294,477 ක හර ශේෂයක් පැවතුණි. සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මෙම හර ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------

විෂය අංක 27801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශනය පරිදි එදිනට අයවීම් හිඟහිටි ශේෂවල එකතුව රු. 2,503,352 ක් වී තිබුණි. ඉන් රු. 90,050 ක් වසර 07 කට වැඩි කාලයක සිට ද, රු. 348,905ක් වසර 3 ත් 7 ත් අතර කාලයක සිට ද, රු. 539,187ක් වසර 1 ත් 2 ත් අතර කාලයක සිට පැවත එමින් තිබුණත්, එම ශේෂ නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 නොවැම්බර් මාසයේ දී ස්ථාන මාරු වී පැමිණි සේවකයකුගේ රු.108,665 ක ණය ශේෂයක් මාස 13ක කාලයක සිට පැවත එමින් තිබුණත්,සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එය නිරවුල් කිරිමට කටයුතු කර නොතිබුණි.

## 3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම |
| --- | --- | --- |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) මුදල් රෙගුලාසි 66 | 531,320 | මූලධන ව්‍යාපෘති අතර සිදු කළ ප්‍රතිපාදන මාරු කිරීම් සඳහා භාණ්ඩාගාර ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොතිබිණි. |
| (ආ) මුදල් රෙගුලාසි 215 | 2,127,124 | රත්නපුර හා ඇහැළියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් 2014 වර්ෂයේ දී මිලදී ගැනීමට කටයුතු කළ භාණ්ඩ එම වර්ෂයේ දී මිලදී නොගෙන වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ සඳහා පිළියෙල කළ චෙක්පත සැපයුම්කරුට භාර නොදී කල් ඉකුත් වූ චෙක්පතක් ලෙස සළසා තැන්පත් ගිණුමට බැර කර තිබුණි. ඒ අනුව එහි ශුද්ධ ප්‍රතිඵලය වන මුදල් රෙගුලාසි 215 සඳහන් විධිවිධානවලට පටහැනිව ඉදිරියේදී කළ යුතු ගෙවීමක් වශයෙන් තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එය නිරවුල් කර නොතිබුණි. |

## 3.5 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

**ප්‍රමාණවත් පරිදි ඉටු නොකළ ව්‍යාපෘති**

නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) ගෘහ ආර්ථික ඒකක විසිපත් ලක්ෂයක් සවිබල ගැන්වීමේ දිවි නැගුම ජාතික වැඩසටහන VI අදියර යටතේ 2014 වර්ෂයේ දී පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබිණි.

| ව්‍යාපෘතිය | වියදම |
|---|---|
| ------------ | ------- |
| | රු. |
| ප්‍රතිලාභීන් 57500 ක් සඳහා පලතුරු පැළ ලබා දීම | 9,948,930 |
| ප්‍රතිලාභීන් 57500 ක් සඳහා එළවළු පැළ ලබා දීම | 2,072,720 |
| රාජ්‍ය ආයතන හා නිලධාරීන්ට පලතුරු පැළ 30809 ක් ලබා දීම | 5,545,620 |
| කතුරුමුරුංගා පැළ 43125 ක් ලබා දීම | 1,293,750 |
| පොල් පැළ 48398 ක් ලබා දීම | 5,000,000 |
| | ------------ |
| | 23,861,020 |
| | ======== |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ප්‍රතිලාභීන් 57500 ක් සඳහා පලතුරු පැළ බෙදා දීම සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

* ප්‍රතිලාභීන් විසින් ඉල්ලුම් කර නොතිබුණු පැළ 9608 ක් සඳහා රු.1,595,940 ක් වැය කර තිබුණු අතර ප්‍රතිලාභීන් විසින් ඉල්ලුම් කළ පැළ ප්‍රමාණයට වැඩියෙන් පැළ 21236 ක් රු. 3,816,280 කට මිලදී ගෙන තිබුණි.

* ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 10 කින් පේර, දෙළුම් හා කොස් පැළ 8765 ක් ඉල්ලා තිබුණ ද, ඒ කිසිවක් ලබා දී නොතිබුණු අතර කොට්ඨාශ 15 කින් ඉල්ලුම් කර නොතිබුණු එකතුව රු.153,000 ක් වූ දෙහි අතු පැළ 2040 ක් සැපයුම්කරුවන් විසින් ලබා දී තිබිණි.

* ඉල්ලුම් කළ පැළ වෙනුවට වෙනත් පැළ ලබාදීම නිසා රු. 80,075 ක් වැඩිපුර ගෙවා තිබිණි.

* දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය මගින් තවාන් පරීක්ෂා කළ ද, මිල දී ගත් රු.373,500 ක පැළ 3300 ක් අඩුපාඩු සහිත විය.

(ii) ග්‍රාම නිලධාරී වසමක තෝරාගත් තවාන්කරුවන්ට කොහුබත් බඳුන් සහ එළවළු බීජ ලබා දී, ඒ මගින් එළවළු පැළ 517,500 ක් ප්‍රතිලාභීන්ට ලබාදීමට කටයුතු යොදා තිබිණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

* කෘෂි නිලධාරීන්ගේ අධීක්ෂණයකින් තොරව තවාන්කරුවන්ට බීජ සහ බඳුන් ලබාදී තිබුණු බව තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි.

* ගොවීන් දැනුවත් කිරීමේ අරමුණින් මෙම බඳුන්වල පැළ තවාන් දැමීම පිළිබඳ පුහුණුවක් රත්නපුර කෘෂි උපදේශකවරුන්ට ලබා දී තිබුණ ද, එම අරමුණ ඉටු වී නොතිබුණි.

* තවාන් පරීක්ෂා කර පැළ වර්ධනය පිළිබඳ නිර්දේශ ලබා දී නොතිබුණු අතර එම පරීක්ෂාවලට අදාළ වර්ධන සටහන්පත් හා තත්ත්ව වාර්තා ලිපිගොනු තුළ නොතිබිණි.

(iii) නිකුත් කර තිබුණු එකතුව රු.35,640 ක් වටිනා කතුරු මුරුංගා පැළ 1188 ක් ද, එකතුව රු.271,000 ක් වටිනා පොල් පැළ 542 ක් ද, බඳුන්ගත පැළ 10630 ක් ද අජීවී තත්ත්වයේ වූ බව ගොවිජන සභාවලින් විගණනය වෙත දන්වා තිබිණි.

(iv) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ උපදෙස් පරිදි සෑම වසමකම ග්‍රාමීය කමිටු හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කමිටු පිහිටුවා නොතිබිණි. මේ නිසා එමගින් ඉටුවිය යුතු වැඩසටහන කාර්යක්ෂමව ක්‍රියාත්මක කරවීම, ප්‍රගතිය විමර්ශනය, ගැටළු හඳුනාගෙන විසඳුම් හා ක්‍රියාමාර්ග ගැනීම යන කාර්යයන් ක්‍රියාවට නංවාලීමට හැකි වී නොතිබුණි.

(v) පූර්ව දැන්වීමක් කරන්නේ නම් පැළ සැපයීමට හැකි බව රත්නපුර රජයේ ගොවිපොල කළමනාකරු විසින් දන්වා තිබුණු අතර රජයේ තවාන්වලින් මිලදී ගන්නා ලෙස කෘෂිකර්ම ලේකම්වරයා විසින් දන්වා තිබුණි. එහෙත් රු.16,995,440 ක පැළ 132,885 ක් අවස්ථා 04 ක දී පුද්ගලික තවාන්කරුවන්ගෙන් මිල දී ගෙන තිබිණි. පැළ ප්‍රවාහනය කර දිය නොහැකි බව රත්නපුර රජයේ ගොවිපොළ මගින් දන්වා තිබීම ඊට හේතු වූ බව දිස්ත්‍රික් ලේකම් විසින් විගණනය වෙත දන්වා තිබිණි.

(vi) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ගෘහ ආර්ථික ඒකක විසිපන් ලක්ෂයක් සවිබල ගැන්වීමේ අරමුණින් 2014 වර්ෂයේ දී ක්‍රියාත්මක කළ දිවිනැගුම VI අදියර ජාතික වැඩසටහන වෙනුවෙන් රත්නපුර දිස්ත්‍රික්කය සඳහා රු. 23,861,020 ක් වැය කර තිබුණි. නමුත් එම ව්‍යාපෘතිවල වර්තමාන තත්ත්වය ඇගැයීම මෙන්ම, නඩත්තුව, පාලනය හා පසු විපරම සඳහා ක්‍රමවේදයක් නොතිබුණි. එහෙයින් ජනතා සහභාගීත්වයෙන් ගෘහ ඒකක සවිබල ගැන්වීම, වස විසෙන් තොර අළුත් එළවළු තම ගෙවත්තෙන් සපුරා ගැනීම, ආහාර සුරක්ෂිතතාවට දායක වීම, පවුලේ පෝෂණ මට්ටම ඉහළ නැංවීම, පවුල තුළ එළවළු සඳහා වැය වන මුදල අවම කර ගැනීම සහ ගෙවතු නිසි පරිදි නඩත්තු කර අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ප්‍රජාව තුළ උද්‍යෝගයක් ගොඩනැගීම යන මූලික අරමුණු කිසිවක් සපුරා ගෙන නොතිබුණි.

(ආ) එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහනේ මූල්‍ය දායකත්වයෙන් යහ පාලනය උදෙසා ග්‍රාමීය ආර්ථික හා ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘතිය (GLED) 2013 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී ආරම්භ කර තිබුණි. ප්‍රතිඵලදායක හා ඉලක්කගත සැලසුම්කරණය, පුරවැසි ප්‍රඥප්තිය, E- පුරවැසි වැඩසටහන, ඒක පුද්ගල ප්‍රතිලාභී ප්‍රවේශය හා ප්‍රජා මූලික සංවිධාන ශක්තිමත් කිරීමේ වැඩසටහන එහි මූලික සංරචක විය. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණයේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) රාජ්‍ය ආයතන විසින් මහජන අවශ්‍යතා මැනවින් ඉටු කිරීමට බැඳීමක් ඇතිකරලීම පුරවැසි ප්‍රඥප්තියේ අරමුණ විය. එහෙත්, මෙම ව්‍යාපෘතිය ආරම්භ කර 2015 ජූනි මාසය දක්වා මාස 17 ක කාලයක් ගත වී තිබුණ ද, එහි පළමු පියවර වූ කාර්ය පරිපාටි සංග්‍රහය පිළියෙල කර නොතිබිණි. මේ නිසා එය පිළියෙල කර මාර්ගෝපදේශ පරිදි පුරවැසි ප්‍රඥප්තියක් ස්ථාපනය නොකිරීම නිසා ඒ වෙනුවෙන් වැය කළ රු.969,095 ක් නිෂ්ඵල වී තිබිණි.

(ii) පුරවැසියන්ගේ තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා දත්ත ගොනුවක් පිළියෙල කර යාවත්කාලීන කිරීම E-පුරවැසි වැඩසටහනේ අරමුණ වුවද, ඊට අවශ්‍ය පරිගණක හා අන්තර්ජාල පහසුකම් සපයා නොතිබීම නිසා ඒ සඳහා වැය කළ රු.21,975 ක් නිෂ්ඵල වී තිබිණි.

(iii) ව්‍යාපාරික දියුණුව සඳහා වූ උපකරණ ඔවුන්ගේම තේරීම මත මිලදී ගෙන ලබා දීම ඒක පුද්ගල ප්‍රතිලාභී ප්‍රවේශය ව්‍යාපෘතියේ අරමුණ විය. ව්‍යාපෘති වාර්තා 187 කින් 12 ක් තෝරා ගෙන එම ප්‍රතිලාභීන්ට රු.448,000 ක උපකරණ ලබා දී තිබුණද, එම කාර්ය සඳහා රු.410,175 ක් වැය කර තිබුණි.

(iv) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ වූ රාජ්‍ය නොවන සංවිධාන ඒකරාශී කර ගෙන ඒ අනුව ප්‍රජා මූලික කමිටු හා ප්‍රාදේශීය කමිටු සකස් කර පසුව දිස්ත්‍රික් කමිටුවක් පිහිටුවීම ප්‍රජා මූලික සංවිධාන ශක්තිමත් කිරීමේ වැඩසටහනේ අරමුණ විය. මේ සඳහා රු.408,900 ක් වැය කර තිබුණත් 2014 වර්ෂය අවසානයේ පිහිටුවිය යුතු දිස්ත්‍රික් කමිටුව 2015 මැයි මාසය වන විටත් පිහිටුවා නොතිබුණි.

(v) තැන්පතු ලේඛනය අනුව, වැඩසටහනෙහි රු.4,084,780 ක් වැය කර තිබුණද, ඒ ඒ ව්‍යාපෘති වෙනුවෙන් වූ වියදම හා මෙම වැඩසටහනේ මුළු වියදම විගණනයේ දී නිශ්චිතව තහවුරු කර ගැනීමට නොහැකි විය.

(ඇ) කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන මත 2013 වර්ෂයේ ක්‍රියාත්මක කළ අතිරේක ආහාර බෝග නිෂ්පාදන වැඩසටහන යටතේ වූ රටකජු බීජ නිෂ්පාදන ප්‍රවර්ධන ව්‍යාපෘතිය සඳහා රු. 1,950,000 ක රටකජු බීජ කි.ග්‍රෑ. 13000 ක් මිල දී ගෙන ගොවීන් අතර බෙදා දී තිබිණි. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ව්‍යාපෘති වාර්තාවට අනුව, සැලැසුම්ගත ඵලදා ඉලක්කය යෙදවුම්වලින් 1:15 ක් වී තිබුණි. විගණනයට ලැබුණු තොරතුරු අනුව ව්‍යාපෘතියේ ප්‍රගතිය යෙදවුම්වලින් 1:7 ක් වැනි අඩු අගයක් ගෙන තිබිණි. මේ නිසා අපේක්ෂා කළ නමුත් නොලද අස්වැන්න මෙට්‍රික් ටොන් 111 ක් වී තිබුණි.

(ඈ) ළමා ලේකම් කාර්යාලයෙන් ලද ප්‍රතිපාදන මගින් සියලු පෙර පාසල් ළමුන් සඳහා නැවුම් කිරි වීදුරුවක් ලබා දිය යුතු වුවද, 2013 හා 2014 වර්ෂවල රත්නපුර ප්‍රදේශයේ වූ මුළු පෙර පාසල්වලින් පිළිවෙලින් සියයට 2.7 ක් හා සියයට 1.8 ක් වන පරිදි ඉතා අඩු පාසල් සංඛ්‍යාවකට මෙම සහනය ලබා දී තිබිණි. එම දෙවර්ෂයේ ලබා දිය යුතු මාස 18 න් මාස 07 ක් පමණක් කිරි ලබා දී තිබුණු අතර 2014 වර්ෂය සඳහා ලද රු. 812,800 ක ප්‍රතිපාදනයෙන් රු.9,360 ක පමණක් වැය කර තිබුණි. 2015 වර්ෂයේ ඔක්තෝබර් මාසය දක්වාම මෙම වැඩසටහන ක්‍රියාත්මක වී නොතිබිණි.

## 3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවල දී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) රාජ්‍ය සේවක හා මධ්‍යම පාන්තික නිවාස ව්‍යාපෘතියක් සඳහා ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු වතුයායකින් හෙක්ටයාර් 14 ක් අත්කර ගැනීමට 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ රත්නපුර ප්‍රාදේශීය ලේකම්වරිය විසින් 2014 පෙබරවාරි මාසයේ දී දැන්වීම් ප්‍රසිද්ධ කර තිබිණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) නිවාසලාභීන් තෝරාගත් පදනම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. නිවාස සුහසාධන සමිතියක් ආරම්භ කර එහි සාමාජිකයින්ගෙන් එකතුව රු.139,890,000 ක් ලබාගෙන එම මුදල් රත්නපුර ප්‍රාදේශීය ලේකම්වරියගේ පුද්ගලික ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබිණි. එම බැංකු ගිණුම ලේකම්වරිය 2000 වර්ෂයට පෙර භාවිතා කළ නමින් එම

ගිණුම විවෘත කර තිබුණි. භාවිතයෙන් ඉවත් කළ නාමයක් නැවත භාවිතයට ගෙන එකම කාල පරිච්ඡේදයක් තුළදී එක් පුද්ගලයෙකු විසින් නම් දෙකක් භාවිතා කරමින් රාජ්‍ය සේවයේ රාජකාරී කටයුතුවල හා මූල්‍ය ගනුදෙනුවල නියැලීම මතභේදයට තුඩු දෙන ගනුදෙනුවකි විය.

(ii) මුදල් රෙගුලාසි 53 ප්‍රකාරව සංවර්ධිත ඉඩම් අත්කර ගැනීම හැකිතාක් මග හැරිය යුතු වුවද, පවරාගත් දේපලෙහි සියයට 75ක් සංවර්ධිත ඉඩම් වූ අතර එහි කුඹුරු අක්කර 5ක් ද විය.

(iii) ඉඩමේ වූ ගොඩනැගිලි සඳහා ප්‍රධාන තක්සේරුකරුගෙන් වාර්තාවක් ලබාගෙන එය අමාත්‍යංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කිරීමට මුදල් රෙගුලාසි 53(2) හා (3) ප්‍රකාරව කටයුතු කර නොතිබිණි.

(iv) නිවාසලාභීන්ගේ තොරතුරු හා ඉඩම් වන්දි ගෙවීම ඇතුළු ඉඩම් බෙදාදීමේ ක්‍රමවේදය පිළිබඳ කිසිදු පැහැදිලි කිරීමක් දිස්ත්‍රික් ලේකම්, රත්නපුර ප්‍රාදේශීය ලේකම් හා නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු කිසිදු පාර්ශවයකින් නොලැබීමත්, ව්‍යාපෘතියේ කිසිදු වගකීමක් කිසිවෙකු විසින් හෝ දරා නොතිබීමත් මත මෙම ඉඩම අත්පත් කරගැනීමේ අරමුණ අවිනිශ්චිත විය.

(v) ඉඩම අත්කර ගැනීම සඳහා රු.110,000,000 ක් රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 අප්‍රේල් මාසයේ දී භාරගෙන තිබිණි. කෙසේ නමුත් නිවේදන නිකුත් කිරීම හැර ඉඩම් අත්කර ගැනීම සඳහා කිසිදු ක්‍රියා මාර්ගයක් ගෙන නොතිබුණු අතර එම මුදල් 2014 අප්‍රේල් මාසයේ සිට දෙසැම්බර් මාසය දක්වා නිෂ්කාර්යව තිබී පසුව ගිණුම් පියවීමේ ප්‍රතිඵලයක් ලෙස එම මුදල් භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබුණි.

(vi) අදාල ඉඩම අත්පත් කර ගැනීමට එරෙහිව භුක්තිකරු විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පවරා තිබුණු අතර අදාල විෂය ලිපිගොනුව අල්ලස් හෝ දූෂණ විමර්ෂණ කොමිෂන් සභාවේ නිලධාරීන් විසින් රැගෙන ගොස් තිබීම හැර මෙම ව්‍යාපෘතියේ කිසිදු ප්‍රගතියක් අනාවරණය වී නොතිබුණි.

(vii) විගණනයට ඉදිරිපත් වූ තොරතුරු අනුව, නිවාස ප්‍රතිලාභීන්ගෙන් එකතු කර ගත් මුදල් 2013 සැප්තැම්බර් මාසයේ සිට ස්ථාවර තැන්පතු හා ඉතිරි කිරීමේ ගිණුම් 05 ක වරින්වර ආයෝජනය කර තිබුණු අතර රු.145,858,078 ක මුළු ලැබීම්වලින් නිවාස ප්‍රතිලාභීන්ට රු.32,860,000 ක් ආපසු ගෙවා තිබුණි. තවත් රු.110,000,000 ක් මහා භාණ්ඩාගාරයට ප්‍රේෂණය කර තිබිණි. ගෙවීම්වලින් රු.149,650 ක හඳුනා නොගත් වියදමක් පැවැති අතර 2015 මාර්තු 19 දින වන විට ගිණුම්වල රු.2,848,428 ක ශේෂයක් පැවැතිණි.

(viii) තැන්පත්කරුවන් 62 දෙනෙකු විසින් තැන්පත් කළ මුදල ආපසු ගෙවා තිබුණද, 2015 මාර්තු මාසය දක්වා ඔවුන්ට හිමිවිය යුතු නමුත් නොගෙවා රඳවාගත් පොලී මුදල රු.1,401,359 ක් වී තිබුණි. එය රජයේ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සිදු කළ සාවද්‍ය මුදල් පරිහරණයක් නිසා රාජ්‍ය සේවයේ කීර්තියට යම් හානියක් සිදු වන්නේය යන්න විගණනයේ දී බැහැර කළ නොහැකි විය.

(ix) ඉඩම අත්පත් කර ගැනීම සඳහා නිවේදන නිකුත් කිරීම ඇතුළු ආනුෂංගික කටයුතු රත්නපුර ප්‍රාදේශීය ලේකම්වරිය විසින් ඉටු කරන අතරතුර නිවාස සුභසාධන සමිතියේ ලේකම්වරිය ලෙස කටයුතු කරමින් රු.මිලියන 139 ක් ඇය විසින් එකතු කර තිබිණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXX වන පරිච්ඡේදයේ 1.10 වගන්තියට හා XXXI පරිච්ඡේදයේ 1.1 වගන්තියට පටහැනිව එම සමිතියේ කටයුතු හා ප්‍රාදේශීය ලේකම්වරියගේ රාජකාරීවල සෘජුව බැඳී තිබුණි.

මේ නිසා ආයතන සංග්‍රහයේ II කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 1:4 වගන්තිය හා 8:2 වගන්තියේ සඳහන් පළමුවන උපලේඛණයේ (4), (10), (12) හා (15) වැනි ඡේද අනුව, රත්නපුර ප්‍රාදේශීය ලේකම්වරිය විසින් රජයේ සේවය මෙන්ම ඇය දරන තනතුරේ කීර්තියට හානි වන ලෙස කටයුතු කර ඇති බව විගණනයේ දී බැහැර කළ නොහැකි විය.

(ආ) නිලධාරීන් 4 දෙනෙකු විසින් නියමිත පරිදි මාසිකව ඉදිරිපත් කර තිබුණු ගමන් වියදම් වවුචර්, රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දීර්ඝ කාලයක් අත රඳවා ගෙන රු.139,521ක් වූ මුළු මුදලම 2015 දෙසැම්බර් 31 දින එක්වර ගෙවා තිබුණි.

(ඇ) පැල්මඩුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදු කළ කර්මාන්ත 02 ක ඉටු කර නොතිබුණු වැඩ වෙනුවෙන් රු.30,810ක් ගෙවා තිබුණි.

(ඈ) ගෘහ ආර්ථික ඒකක විසිපන් ලක්ෂයක් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ පෞද්ගලික තවාන්කරුවන් විසින් නොමිලේ පැළ ප්‍රවාහනය කර දීමට ගිවිසුම් ගතව බැඳී තිබුණ ද, ඒ පිළිබඳව කිසිදු සැලකිල්ලක් නොදක්වා ඊට පසු නිකුත් කළ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලිපියක් පදනම් කරගෙන රු.521,320 ක් පැළ ප්‍රවාහනය සඳහා ගෙවා තිබිණි. කෙසේ නමුත්, මෙය අයකර ගන්නා බව දිස්ත්‍රික් ලේකම් විසින් විගණනය වෙත දන්වා තිබුණි.

## 3.7 අවිධිමත් ගනුදෙනු

--------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළැඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැර වීම**

**------------------------------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂාවේ දී අනාවරණය වූ රජයේ ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටියෙන් බැහැරව සිදු කළ ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශය පටහැනිව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක් විසින් කර්මාන්ත 1103 ක් වෙනුවෙන් රු.545,213,986 ක් ප්‍රජා පාදක සංවිධාන වෙත ගෙවා තිබිණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 මාර්ගෝපදේශයට පටහැනිව ඇස්තමේන්තුගත පිරිවැය රු.80,668,323 ක් වූ සංස්කෘතික මධ්‍යස්ථාන 06 ක ඉදිකිරීම් රු.2,000,000 කට වඩා අඩුවන පරිදි කොටස් කර ප්‍රජා සංවිධාන 11 ක් වෙත පවරා දී තිබුණි. එමෙන්ම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1 හා 4.4 මාර්ගෝපදේශවලට පටහැනිව රු.16,506,145 ක් එම සංවිධාන වෙත ගෙවා තිබුණි. එමෙන්ම, එම සංවිධානවලට කොන්ත්‍රාත්තුව සම්බන්ධව ඇති හැකියාව, ලියාපදිංචි සුදුසුකම්, පූර්ව කොන්ත්‍රාත් කටයුතු හා ඉක්වැඩි ශ්‍රේණිගත කිරීම් යනාදිය විධිමත් කමිටුවක් මගින් සළකා බලා නොතිබුණි.

(iii) ඒක පුද්ගල ප්‍රතිලාභී ප්‍රවේශය ව්‍යාපෘතිය යටතේ ප්‍රතිලාභීන්ට ලබා දුන් රු.410,175 ක උපකරණවල ගුණත්වය පිළිබඳ සහතිකයක් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.3 මාර්ගෝපදේශය ප්‍රකාරව ස්ථානභාර නිලධාරී විසින් ලබා දී නොතිබුණි.

(iv) එක් සංස්කෘතික මධ්‍යස්ථානයක හා රජයේ නිවාස 02 ක ඉටු කළ අතිරේක වැඩ පිළිවෙලින් සියයට 28 ක්, 19 ක් හා 17 ක් වී තිබුණ ද, රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.13.4 මාර්ගෝපදේශය ප්‍රකාරව ඒ සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය මත රු.1,531,883 ක මුළු පිරිවැය ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කර නොතිබුණි.

(ආ) රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල නව ගොඩනැගිල්ල සඳහා තිර රෙදි මිලදී ගැනීමට ඇස්තමේන්තු කර නොතිබුණු අතර සැපයුම්කරුගේ ගණනය කිරීම් මත රු.436,625 ක් ගෙවා තිබුණි. ගෙවීම් කිරීමේ දී ඉටු කළ වර්ග අඩි ප්‍රමාණය සඳහා කාර්මික නිලධාරීගේ නිර්දේශයක් ලබාගෙන නොතිබුණි.

**3.8 මෙහෙයුම් දුර්වලතා**

-----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්ගේ මාර්ගෝපදේශ පරිදි ආපදාව සිදු වී මාස 12 ක් ඇතුළත සහනාධාරය ගෙවා අවසන් කළ යුතු වුව ද, අයගම හා නිවිතිගල ප්‍රදේශවල 2014 පළමු කාර්තුවේ දී සිදු වූ නිවාස හානි සඳහා රු.938,000 ක් 2015 අගෝස්තු මාසය වන විටත් ගෙවා නොතිබුණි.

(ආ) අයගම ප්‍රදේශයේ වසම් 03 ක නායයාම් තත්ත්වය පිළිබඳ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයට 2014 ඔක්තෝබර් මාසයේ දී දන්වා තිබුණ ද, 2015 අගෝස්තු මාසය වන විටත් ඒවායේ පරීක්ෂණ වාර්තා ලබා ගෙන නොතිබුණි. එමෙන්ම, ආපදා සහන සේවා අංශය සතු ඔරු අඟුල් හා මෝටර් බෝට්ටු ආවරණයක් නොමැතිව අනාරක්ෂිතව පැවතිණි.

(ඇ) ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන යටතේ 2014 වර්ෂයේදී මිලදී ගත් රු.5,577,906 ක භාණ්ඩ 2014 දෙසැම්බර් 31 දින වන විට අදාළ ප්‍රතිලාභීන් වෙත ලබා නොදී 2015 ජූනි මාසය දක්වාම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිෂ්කාර්යව රඳවා තිබුණු අතර ඇතැම් භාණ්ඩ කාර්යාල භූමියේ අනාරක්ෂිතව පැවතිණි. එමෙන්ම, 2014 වර්ෂයේ දී තවත් භාණ්ඩ තොගයක් සඳහා රු. 2,302,025 ක් ගෙවා තිබුණ ද, ඒවා 2015 ජූනි මාසය වන විටත් කාර්යාලයට ලැබී නොතිබුණි. මුදල් රෙගුලාසි 137(5) පරිදි භාණ්ඩ නිවැරදි ලෙස භාරගෙන තිබෙන බවට කිසිදු තහවුරු කිරීමක් රහිතව මෙම ගෙවීම් සඳහා අනුමැතිය ලබා දී තිබුණි.

(ඈ) ප්‍රාදේශීය සංවර්ධන වැඩසටහන යටතේ ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් 2014 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු රු.1,310,925 ක් වූ භාණ්ඩ 2015 ජූනි මාසය වන විටත් බෙදාහැර නොතිබුණි. එම භාණ්ඩවල වගකීමේ කාලය ද භාවිතයට නොගෙනම මාස 06 ක් කල් ඉකුත් වී තිබුණි. එමෙන්ම, රු.1,069,556 ක් ගෙවා තිබුණ ද එම භාණ්ඩ 2015 ජුනි 16 වන විටත් කාර්යාලය වෙත ලැබී නොතිබිණි.

(ඉ) ශ්‍රී ලංකා කාන්තා කාර්යංශයේ ප්‍රතිපාදනවලින් ඇහැලියගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ක්‍රියාත්මක කළ චක්‍රීය ණය වැඩසටහන යටතේ 2013 දෙසැම්බර් මාසයේ සිට 2015 ජූනි මාසය දක්වා රු.310,000 ක ණය නිකුත් කර තිබුණි. ඉන් රු.82,040 ක් ආපසු අය කර ගෙන තිබුණත්, එම මුදල් අත රඳවා ගෙන තිබිණි. මේ නිසා ලද මුදල්, ණය නිකුත් කිරීම වෙනුවෙන්ම භාවිතා කළ බවට තහවුරු සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. එමෙන්ම, ගෙවීම් වවුචර්, මුදල් පොත් නොතිබීම නිසා මුදල් අවභාවිතාවීමක් සිදු විය හැකි බව විගණනයේ දී බැහැර කළ නොහැකි විය. කල් ඉකුත් වූ රු. 255,560 ක හිඟහිටි ණය ශේෂයක් ද 2014 දෙසැම්බර් 31 දිනට පැවතිණි.

## 3.9 කළමනාකරණ දුර්වලතා

----------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) දෝෂ වගකීම් කාල සීමාව ඉකුත්ව ගියද, කර්මාන්ත 93 කින් ලබාගත් රු.3,905,678 ක රඳවා ගත් මුදල් නිදහස් නොකර රත්නපුර හා ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල රඳවාගෙන තිබිණි.

(ආ) ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් පැල්මඩුල්ල ඉහල බෝපිටිය ප්‍රදේශයේ භූ ස්ථාවරත්වය පිළිබඳ 2013 වර්ෂයේ සිදු කළ පරීක්ෂණ පරිදි නිවැසියන්ගෙන් සැදුම්ලත් ආපදා කළමනාකරණ ව්‍යුහයක් සකසා නොතිබුණි. එම නිවැසියන්ට නව නිවාස ඉදි කිරීමට අවශ්‍ය ඉඩම් කහවත්ත වැවිලි සමාගමෙන් නිදහස් කර ගත යුතුව තිබුණත් එම කාර්ය ඉටු කර නොතිබුණි.

(ඇ) අවම මිල ඉදිරිපත් කළ ලංසුකරුගේ පූර්ව කාර්යසාධනය සතුටුදායක නොවීමත්, රු.5,481,814 ක වෙනත් කර්මාන්තයක් ඔහු වෙත ලබා දීමට නිර්දේශ කර තිබීමත් නිසා යෝජිත මෙම කොන්ත්‍රාත්තු ඔහු විසින් 2014 වර්ෂය ඇතුළත නිම කිරීමේ අවදානමක් පවතින බවට ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබුණි. මේ නිසා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ පළාත් නැගුම වැඩසටහන මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිතව පැවැති කර්මාන්ත 02ක් සඳහා ඉදිරිපත් කළ අවම මිල ප්‍රතික්ෂේප කර ඊලඟ අවම මිල ඉදිරිපත් කර තිබුණු ලංසුකරුවන් වෙත ප්‍රසම්පාදනය පිරිනමා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

(i) ඉහත අවම මිල ඉදිරිපත් කළ ලංසුකරු වෙත ඉදිකිරීම් හා පුහුණු කිරීමේ අභ්‍යාස ආයතනය (ICTAD) විසින් නිකුත් කළ කොන්ත්‍රාත්කරුවන්ගේ වාර්තා පොත අනුව, ඔහුගේ පූර්ව ඉදිකිරීම් කටයුතුවල සැලකිය යුතු ප්‍රමාදයන් සිදු කර නොතිබුණි. එමෙන්ම, පූර්ව කාර්යසාධනය අසතුටුදායක බවට ප්‍රමාණාත්මක සාක්ෂි නොතිබුණි.

(ii) අවම මිල ප්‍රතික්ෂේප කර දෙවැනි ලංසුකරුට පිරිනමන ලද ඉහත ඉදිකිරීම් කිසිවක් 2014 වර්ෂය තුළදී නිම කර නොතිබුණු අතර 2015 මැයි මාසය වන විටත් ඒවායේ ඉටු නොකළ වැඩ ප්‍රමාණය පිළිවෙලින් සියයට 74 ක් හා සියයට 12 ක් විය.

(iii) ප්‍රසම්පාදන කමිටුව විසින් ගත් තීරණයේ දෝෂසහගතභාවය මත අවම මිලට ප්‍රසම්පාදනය පිරිනමා නොතිබුණු බැවින් රු.843,711 ක පාඩුවක් රජයට සිදු වී තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු රජයේ නිවාස 37 ක් ශ්‍රේණිගත කර පවත්වා තිබුණද, එය ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 3 වන වගන්තිය පරිදි මාසික වැටුප අනුව නිලධාරී පංති අනුව නිවාස ශ්‍රේණිගත කිරීමක් සිදුකර නොතිබුණි.

එම නිවාස සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේ දී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) 2014 දෙසැම්බර් මාසයේ දී රු.3,580,653 ක් වැය කර B 04 නිවස සංචාරක බංගලාවක් ලෙස නිම කර තිබුණි. 2015 මැයි මාසය වන විටත් එය භාවිතා කිරීමකින් තොරව නිසි පරිදි ආරක්ෂා කර නොතිබුණි.

(ii) B 11 නිවාසය රු.3,247,268 ක් වැය කර සංචාරක බංගලාවක් ලෙස නිම කර තිබුණි. ඉන් පසු මාස 06 ක් වසා දමා තිබුණු අතර 2010 ජුනි මාසයේ දී නිලධාරියකුට පදිංචිය සඳහා ලබා දී තිබුණි. 2015 මැයි මාසය වන විටත් සංචාරක බංගලාවක් ලෙස භාවිතා කර නොතිබුණි.

(iii) B 04 නිවාසයට අයත් වර්ග අඩි 800 ක ගොඩනැගිල්ලක් 2009 ජුනි මාසයේ සිට 2015 මැයි මාසය දක්වාම කිසිදු භාවිතයකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

(iv) B 04 නිවසට අයත් පිවිසුම අසල අනවසර ගොඩනැගිල්ලක් ඉදිකර තිබුණි. දිස්ත්‍රික් ලේකම් විසින් 2007 ජුලි මාසයේ දී එය පරීක්ෂා කර වාර්තා කරන ලෙස රත්නපුර ප්‍රාදේශීය ලේකම් වෙත දැනුම් දී තිබුණ ද, විගණිත දින වූ 2015 මැයි මාසය වන විටත් ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(v) නිල නිවාසයක් වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් ගෙවා තිබුණු රු.16,293 ක භිඟ ජල ගාස්තු සහ සම්බන්ධ කිරීමේ ගාස්තු එවකට එහි පදිංචිව සිටි නිලධාරියාගෙන් අයකර නොතිබුණි.

(vi) නිවාස 15 ක අලුත්වැඩියා ප්‍රමාද වීම නිසා ඇතැම් නිවාස පදිංචි වීමට නොහැකි වන පරිදි විනාශ වී තිබුණි. පදිංචිකරුවන් ඉල්ලීම් කළ ද ඒවා ඉටු නොවීමේ ප්‍රමාද කාලය වසර 01 ක සිට වසර 07 ක් දක්වා කාල පරාසයක විය. වර්ග අඩි 1417 ක් වූ එක් නිවසක් 2011 වර්ෂයේ සිට අලුත්වැඩියාව සඳහා වසා තිබුණද, 2016 මැයි 21 දින වන විටත් අලුත්වැඩියා කිරීමකින් තොරව වල්බිහි වී තිබිණි.

(vii) නිවාස 04 ක පදිංචිකරුවන් විසින් වර්ෂ 05 ක් අවසානයේ යළිත් පදිංචිය දීර්ඝ කර ගැනීම නිසා පොරොත්තු ලේඛනගත නිලධාරීන්ට තිබුණු අවස්ථා අහිමි වී තිබුණි.

(ඉ) හිමිකාරත්වයක් නොමැති වාහනයක් වෙන්දේසි කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පියවර ගෙන තිබුණු අතර එය රු.765,000 කට මිලදී ගත් ගැනුම්කරුට එය මිලදී ගෙන වර්ෂ 03 කට වැඩි කාලයක් ගත වී තිබුණද, එහි අයිතිය පවරා ගැනීමට නොහැකි වී තිබිණි.

## 3.10 අරමුණුගත නොවන වියදම්

-------------------------------

නියැදි විගණන පරීක්ෂණවල දී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ග්‍රාමීය පාසල්වල සනීපාරක්ෂක හා අනෙකුත් පහසුකම් වැඩි දියුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණි. එසේ වුවද, රත්නපුර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ගේ වර්ගීකරණය අනුව, දිස්ත්‍රික්කය තුළ දුෂ්කර හා ග්‍රාමීය පාසල් 407 ක් පැවැතුණද, එම පාසල්වල ඇති ප්‍රමුඛ

අවශ්‍යතා අධ්‍යයනය කිරීමකින් තොරව ග්‍රාමීය නොවන පාසල් 121 ක සංවර්ධනය සඳහා එකතුව රු.42,547,247 ක් වැය කර තිබුණි.

(ආ) ග්‍රාමීය සංවර්ධනය සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදනවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ප්‍රාදේශීය සභා කාර්යාල, ගොවිජන සේවා මධ්‍යස්ථාන හා රජයේ නිල නිවාස වැනි රජයේ දේපල සංවර්ධනය සඳහා රු.8,155,526 ක් 2014 වර්ෂයේදී වැය කර තිබිණි.

**3.11 නිෂ්ඵල වියදම්**

-----------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගනුදෙනු සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අඩුපාඩු පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) කොරියානු රජයේ සෙමාවුල් උන්ඩොන් ව්‍යාපෘති ආධාර මගින් 2012 වර්ෂයේ සිට ඇහැළියගොඩ එපිටවත්ත කම්මල් ගම්මානයේ සංවර්ධන කටයුතු සිදු කරමින් පැවැතුණි. මේ සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2013 වර්ෂයේ රු.564,064 ක් වටිනා දුනුකොළ තුනී කිරීමේ යන්ත්‍රය ලැබී තිබුණු අතර එය 2015 ජුලි මාසය වන විටත් සවිකර නොතිබුණි. එමෙන්ම යකඩ තලන යන්ත්‍රයද (Belt hammer Machine) එය සවිකළ 2007 වර්ෂයේ සිටම අක්‍රියව පැවැතුණි.

(ii) මූල්‍යමය පහසුකම් ලබා දී තිබුණද, නිසි අධීක්ෂණයක් නොමැති වීම නිසා කම්මල් 18 කින් 2015 ජුලි මාසය වන විට කම්මල් 03 ක වැඩ අවසන් කර නොතිබුණු අතර වැඩ අවසන් කළ කම්මල් 04 ක නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි.

(iii) විදේශ සංචාර සඳහා සහභාගී වූ සංඛ්‍යාව සහ ඒ සඳහා ශ්‍රී ලංකාවෙන් සහ කොරියාවෙන් කරන ලද සම්පූර්ණ වියදම ඇතුළුව සමස්ත ව්‍යාපෘති වියදම පිළිබඳ තොරතුරු ප්‍රතිපත්ති සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(iv) නව තාක්ෂණය හඳුන්වා දීම, මූලික යටිතල පහසුකම් සපයා දීම, අලෙවිකරණ ක්‍රමවේදයක් හා නිෂ්පාදන සඳහා වෙළඳපොලක් හඳුන්වා දීම සහ සංවිධිත කම්මල් ගම්මානයක් ඇති කිරීම යන ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණු අතර කම්මල්කරුවන් විසින් ඔවුන් පාරම්පරිකව කළ පිහි නිෂ්පාදනය පමණක් සිදු කරමින් පැවැතුණි. ඒ නිසා මේ වෙනුවෙන් රු. 4,161,000 ක වැය ඵලදායක වී නොතිබුණි. එමෙන්ම, ලද තොරතුරු අනුව, රු.758,209 ක් වැය කර අවස්ථා 04 ක දී ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ද ඇතුළුව රජයේ නිලධාරීන් 12 දෙනෙකු මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් විදේශ සංචාරවල නියැලී තිබුණද, කම්මල්කරුවන්ගේ උන්නතිය වෙනුවෙන් ඉන් කිසිදු දායකත්වයක් ලැබී නොතිබුණි.

(ආ) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් රත්නපුර දිස්ත්‍රික්කයට සළසා තිබුණු ප්‍රතිපාදන වඩාත් කාර්යක්ෂමව යෙදවීමේ අරමුණු ඇතිව දැනුවත් කිරීමේ රැස්වීමක් 2014 මාර්තු මාසයේදී පවත්වා තිබිණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) කිසිදු ප්‍රසම්පාදන කමිටු තීරණයකින් තොරව රු.2,396,550 ක සේවා සපයා ගැනීමක් වෙනුවෙන් ලංසු කැඳවා තිබුණි. එම ලංසු විවෘත කිරීම දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරයාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් විසින් සිදු කර තිබුණද, ඊට කිසිදු ලංසුකරුවෙකු සහභාගී වී නොතිබිණි.

(ii) මෙම උත්සවය සඳහා අවශ්‍ය තහඩු ආවරණය ඇතුළු අනෙකුත් උපකරණ අඩු මිලකට රත්නපුර ප්‍රදේශයෙන්ම සපයා ගැනීමට හැකියාව තිබියදීත්, ඒ පිළිබඳ සැලකිලිමත් නොවීම නිසා රු. 613,350 ක් වැඩිපුර ගෙවීමට රජයට සිදු වී තිබිණි.

(iii) විවිධ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු මගින් ප්‍රාදේශීය සංවර්ධනය සඳහා ලැබෙන ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් වැය කර ප්‍රාදේශීය සංවර්ධන කටයුතු ඉටු කිරීම අතීතයේ සිට දිගින් දිගටම ක්‍රමවත්ව පැවැතුණු කාර්යයක් විය. මේ නිසා අධික වියදමක් දරමින් තවදුරටත් දැනුවත් කිරීමට කටයුතු කිරීම ඵලදායී කාර්යයක් නොවූ බැවින් මේ වෙනුවෙන් වැය කළ එකතුව රු. 3,767,606 ක් නිෂ්ඵල වී තිබුණි.

(ඇ) සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදනවලින් ඉදිකිරීම් ආරම්භ කළ සංස්කෘතික මධ්‍යස්ථාන 07 ක් සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) නේපත්‍යාගාර, වේදිකා, ගබඩා වැනි මූලික අවශ්‍යතා සම්පූර්ණ නොවීම නිසා ගොඩකවෙල සංස්කෘතික මධ්‍යස්ථානය අවට වල් බිහි වී භාවිතයකින් තොරව පැවැතිණි. විදුලි සවිකිරීම් අස්ථානගත වී තිබුණු අතර එහි පැවැති කොස් ලෑලි දොරවල් ආරක්ෂාව සඳහා ගලවා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රඳවා තිබුණි.

(ii) කහවත්ත සංස්කෘතික මධ්‍යස්ථානය ඉදි කිරීම් ආරම්භ කිරීමට පෙර භූ ස්ථාවරත්වය සම්බන්ධයෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් නිර්දේශ ලබා නොගැනීමත්, ඉදි කිරීම් ආරම්භ කිරීමෙන් පසු එම භූමියේ පැවැති නාය යෑමේ අවදානම මත එම ආයතනයෙන් ලබා ගත් නිර්දේශවලට අනුව කටයුතු නොකිරීමත් නිසා 2013 දෙසැම්බර් මාසය වන විට ඉදි කිරීම් නිම කළ ගොඩනැගිලි පවා කිසිදු කටයුත්තක් සඳහා යොදා ගැනීමට නොහැකිව පැවැතුණි.

(iii) කොලොන්න සංස්කෘතික මධ්‍යස්ථානය ඉදි කිරීමට 2010 වර්ෂය දී රු.676,714 ක් වැය කර අත්තිවාරම දැමීම හැර වෙනත් කිසිදු කාර්යයක් සිදු කර නොතිබිණි.

(iv) 2010 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කළ නමුත් 2015 දෙසැම්බර් වන විටත් ඒවායේ වැඩ කටයුතු නිම කර අරමුණුගත කාර්යයෙහි යෙදවීමට අපොහොසත් වීම නිසා සංස්කෘතික මධ්‍යස්ථාන 07 ක් ඉදිකිරීම වෙනුවෙන් එම කාල පරිච්ඡේදය තුළ වැය කළ රු.18,671,118 ක් නිශ්ඵල වී තිබිණි.

(ඈ) පාසලක් ඉදිකිරීමට අක්කර 10 ක ඉඩමක් එළි පෙහෙළි කළද, එවැනි පාසලක් ඉදි කර නොතිබුණු අතර එය නැවතත් කැලයෙන් වැසී තිබුණි. මේ නිසා ඒ වෙනුවෙන් රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් කළ රු.333,471 ක වියදම නිෂ්ඵල විය.

## 3.12 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 59 | 49 | 01 | - |
| (ii) | තෘතියික මට්ටම | 41 | 22 | 19 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,204 | 1,150 | 77 | 23 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 179 | 183 | 01 | 05 |
| | **එකතුව** | **1,483** | **1,404** | **98** | **28** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) 1992 වර්ෂයෙන් පසු අනුමත කාර්ය මණ්ඩලය ප්‍රතිශෝධනයට ලක් කර නොතිබිණි.